**කුරුවිට ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභා ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 28 ක් හා විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්ත 05 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු රු. 16,910,533 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් හා වියදම් මෙන්ම ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල නමුත් උපලබ්ධි නොවූ ස්ථාවර තැන්පත් පොළී රු. 4,133,405 ක් ස්ථාවර තැන්පතු ගිණුමට හර කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබූ රු. 270,835 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂය තුල මිලදී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබූ පරිගණක යන්ත්‍ර 06 ක වටිනාකම රු. 304,987 ක් අඩුවෙන්ද, ලී බඩු හා උපකරණ වටිනාකම රු. 62,375 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | මිලදී ගත් වත්කම්වල වටිනාකම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආසියානු සංවර්ධන බැංකු ණය සඳහා ගෙවන ලද පොළී රු. 135,558 ක් මූලික ණය මුදලෙන් අඩුවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ඊ) | 2019 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපූර්ණය කලයුතු වැටුප් රු. 90,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම් හා ලැබිය යුතු දෑ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අඩුපාඩු පරික්ෂා කර බලා 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (උ) | ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 31,529,845 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳිය යුතුවේ. | මාසිකව ශේෂ සංසන්දනය කිරීම කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වමි. |
| (ඌ) | රු. 8,935,055 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, දීර්ඝ කාලයක් පුරා ඉදිරියට ගෙන එන මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගිණුම් ලෙජරයේ පෙර සිට පැවත එන බවත් මේ පිළිබඳ කිසිඳු තොරතුරක් සොයා ගැනීම අසීරු බවත් දන්වමි. |
| (එ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු. 50,868,601 ක ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) ඇ | 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 27 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ අතරින් ඇතැම් අත්තිකාරම් වගකිව යුතු නිලධාරීන්ගෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | | කදී ලබාදී තිබූ රු. 856,654 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | | අයකර ගැනීමට උපදෙස් දී ඇති බවත්, ඉතිරි අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලයට අදාල එකතුව රු. 22,748,724 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල තැන්පතු ආදායමට ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නියමිත පරිදි ඉන්ධන දහන පරික්ෂාවන් සිදුකරන බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාර්ෂික කාර්යසාධන ගිවිසුම් ඇතුලත් කර නොමැති නිලධාරීගේ කාර්යසාධන වාර්තා ඉදිරියේදී අත්සන් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගැනීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභියාට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | කාර්යාලය ක්‍රමවත් කර අන්තර්ජාල පහසුකම් යථාවත් කල පසු මෙම කටයුතු ඉටුකිරීමට අපේක්ෂා කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,751,962 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 7,556,116 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,189,561 | 6,297,680 | 4,067,856 | 5,999,782 | 4,361,429 | 3,492,486 | 3,451,687 | 4,603,567 |
| කුලී | 6,439,731 | 7,897,979 | 7,541,848 | 2,043,115 | 6,889,007 | 6,638,685 | 6,810,605 | 1,720,321 |
| බලපත්‍ර ගාස්තු | 1,794,550 | 2,727,035 | 2,723,035 | - | 1,225,150 | 2,080,378 | 2,076,028 | - |
| වෙනත් ආදායම් | 37,240,944 | 26,854,289 | 85,043,489 | 32,847,561 | 21,777,804 | 28,394,418 | 23,473,754 | 38,830,796 |
| | 54,664,786 | 43,776,983 | 99,376,228 | 40,890,458 | 34,253,390 | 40,605,967 | 35,812,074 | 45,154,684 |

#### 2.2.2 වරිපනම් හා බදු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **වරිපනම්** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 6,522,397 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 545 කින් අයවියයුතු රු. 3,267,303 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් දේපළ තහනමකට යාමට නොහැකි වී ඇති බවත්, හිඟ ශේෂයෙන් කොටසක් අයකරගෙන ඇති බවත් දන්වමි. |
| (ආ) | **අක්කර බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 504,067 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 384 කින් අයවිය යුතු රු. 422,183 ක් ඇතුලත් වී තිබුණි. | අක්කර බදු සත්‍යාක්ෂණයක් සිදුකර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු සත්‍යාක්ෂණය ආකෘති පත්‍ර කිරිඇල්ල හා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2019 අගෝස්තු 21 දින යොමු කර ඇතත් මේ වන තෙක් තොරතුරු ලැබී නොමැති බව දන්වමි. |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ආයතන හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් කර නොතිබීම හේතුවෙන් අදාල බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන බලපත්‍ර ලබාගෙන තිබේද යන්න තහවුරු කරගත නොහැකි විය. | වාර්ෂික සමීක්ෂණ මඟින් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකළ යුතු සියළු ආයතන හඳුනාගෙන අදාල ගාස්තු අයකර ගත යුතුවේ. | 2021 වර්ෂය සඳහා අදාල සමීක්ෂණ කටයුතු සිදුකර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතනවලින් බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,396,022 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු 2020 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත ලැබිය යුතු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මේ පිළිබඳව දැනුවත්ව නොසිටි බවත්, 2020 වර්ෂයේදී සැලසුම් සකස් කර ඇති බවත් දන්වමි. |

**3.2 ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහජන නියෝජිතයින් හා නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණින් 2019 ජනවාරි මස තෙදිනක, කලාවැව ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනයේ හා 2019 ඔක්තෝබර් මස දෙදිනක, ඌව කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික වැඩමුළු දෙකක් පවත්වා තිබුණි. එහෙත් 45 ක් වූ සභිකයින් අතුරින් 26 දෙනෙකු පළමු වැඩමුළුව සඳහා ද, 39 දෙනෙකු දෙවන වැඩමුළුව සඳහා ද සහභාගී වී නොතිබුණු අතර, නිලධාරී සහභාගීත්වය පිළිවෙලින් 08 ක් හා 13 කට සීමා වී තිබුණි. ඒ අනුව වැඩමුළුව පැවැත්වීමේ අරමුණ ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී ඇති අතර, වැඩමුළුව සඳහා වැයකර තිබූ රු. 493,932 ක මුදල නිෂ්ඵල වී තිබුණි. | වඩාත් සැලසුම්සහගත ලෙස හා ඵලදායී ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | පුහුණු වැඩමුළු පිළිබඳව සියළු මහජන නියෝජිතයින් හා නිලධාරීන් දැනුවත් කලද, විවිධ පෞද්ගලික හේතුන් මත එම සියළු පිරිසට සහභාගී වීමට නොහැකි වූ බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 01 ත් 10 ත් අතර කාලයක සිට පැවතඑන එකතුව රු. 676,267 ක් වූ සේවක ණය ශේෂ 27 ක් අයකර ගෙන නොතිබුණි. | ණය මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 06 රූඩ් 01 පර්චස් 20 ක වපසරියකින් යුත් නිතිය මණ්ඩිය මූකලාන ඉඩම දේපළ වෙළඳ සමාගමක් විසින් කොටස් කර විකිණීමට කටයුතු කර තිබුණු අතර, ඊට අදාල ප්‍රචාරණ දැන්වීම්වල ඉඩම් කොටස්වල වටිනාකම පර්චසයක් රු. 89,000 සිට ඉහලට ලෙස ප්‍රදර්ශනය කර තිබුණි. එහෙත් සභාවේ | සභාව වෙත අයවිය යුතු ආදායම් නිවැරදිව හා අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල බිම් කට්ටි සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විකුණුම් මුදලට අදාළව සියයට 01 ක බදු මුදල ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

ආදායම් පරීක්ෂක විසින් පර්චස් එකක වටිනාකම රු. 57,750 ක් ලෙස තක්සේරු කර තිබීම හේතුවෙන් සියයට 01 බද්ද ලෙස සභාවට ලබා ගත හැකිව තිබූ රු. 318,750 ක ආදායමක් අහිමි වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ කැබ් රථයක් හා අත් ට්‍රැක්ටර් 02 ක් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවන තත්ත්වයේ නොපවතින වාහන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව අපහරණය කළ යුතුවේ. | කැබ් රථය හා අත් ට්‍රැක්ටර් 02 වෙන්දේසි කිරීමට අනුමැතිය ඉල්ලා ආණ්ඩුකාර කාර්යාලය වෙත ලිපියක් යොමුකර ඇතත් එයට මෙතෙක් අනුමැතිය ලැබී නැති බව දන්වමි. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව පරිහරණය කරන වාහන 13 ක් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව පරිහරණය කරන වාහන විධිමත්ව පවරාගත යුතුවේ. | ලියාපදිංචි අයිතිය සභාව වෙත පවරාගෙන නොමැති වාහන සියල්ලෙහි අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අළුත්වැඩියා කිරීම සඳහා 2014 ජනවාරි මාසයේදී භාරදී තිබූ කැබ් රථයක් අළුත්වැඩියා කටයුතු අවසන් කිරීමට වසර 05 ක කාලයක් ගතවී තිබුණි. රු. 495,000 ක් වැයකර අළුත්වැඩියාවෙන් පසු කැබ් රථය 2019 මාර්තු 11 දින සභාවට ලැබී තිබුණද, ධාවනය සඳහා යොදවා නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | කැබ් රථයේ අයිතිය පැවරීම සම්බන්ධ ගැටළුව කඩිනමින් විසඳාගෙන එය ඵලදායී ලෙස භාවිතයට ගත යුතුවේ. | කැබ් රථයේ අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බවත්, පැවරීම ප්‍රමාදවීම නිසා ආදායම් බලපත්‍රය ලබා ගැනීම ගැටළුකාරී වී ඇති බැවින් කැබ් රථය ධාවනයේ නොයොදා සභා භූමිය තුල නවතා තබා ඇති බව දන්වමි. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනත මගින් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ චක්‍රලේඛයකින් ලබා දී ඇති අධිකාරී බලයකින් තොරව මහජන නියෝජිතයින් 34 දෙනෙකු වෙත එකතුව රු. 5,200,000 ක ණය අත්තිකාරම් ලබා දී තිබුණි. | ප්‍රාදේශීය සභා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ අධිකාරී බලයක් ලබා ගැනීමෙන් තොරව ණය අත්තිකාරම් ලබා නොදිය යුතුවේ. | 2018 ජුනි 19 දින මහ සභාවේ වෙනත් කරුණු යටතේ 12-01 දරන සභා තීරණය අනුව අදාල ණය ලබාදී ඇති බව දන්වමි. |

## 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් රු. 12,115,818 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කර ගතයුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ බවත්, 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර සභා සම්මත කර ඇති බවත් දන්වමි. |

### 3.7.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 නොවැම්බර් 25 දිනැති මහා සභා තීරණය පරිදි 2019/2020 ශ්‍රීපාද වන්දනා සමය ආරම්භ කිරීමේ පෙරහැර කටයුතු වෙනුවෙන් රු. 100,000 ක් වැයකර තොරණක් ඉදිකර තිබූ අතර, ඒ සඳහා ආයතනයක් තෝරා ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1(අ)(iii) හා (ආ) මාර්ගෝපදේශ වලට පටහැනිව සිදුකර තිබුණි. | භාණ්ඩ, වැඩ හෝ සේවා සපයා ගැනීමේදී සැමවිටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | මෙම තොරණ ඉදිකිරීම කඩිනමින් ඉටුකළ යුතු අත්‍යාවශ්‍ය කාර්යයක් වූ නිසා හදිසි ප්‍රසම්පාදන යටතේ සභා තීරණ පරිදි කටයුතු කළ බව දන්වමි. |

### 3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත දෙකකට අදාලව රු. 408,702 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුවේ. | අයකර ගැනීමට ඇති මුදලින් රු. 144,871 ක් රැදවුම් මුදලින් අයකර ගෙන ඇති බවත්, ඉතිරිය සති 02 ක කාලයක් තුල අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### නොවිසඳී ඇති නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2009 වර්ෂයේදී නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 05 ක් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ලබාදීම හේතුවෙන් ගෙවීම් පැහැරහැර තිබෙන හිඟ කඩකුලිය හා ප්‍රමාද ගාස්තු රු. 4,436,000 ක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | කඩකාමර බදුදීමේදී නිසි පරිදි ගිවිසුම්ගත වියයුතු අතර, වගකිව යුත්තන් නිශ්චය කර විනයානුකූලව කටයුතු කළ යුතුවේ. | අදාළ කඩකාමර සඳහා අයවිය යුතු ප්‍රමාද ගාස්තු කපා හැරීමට ආණ්ඩුකාරවර අනුමැතිය 2019 දෙසැම්බර් මස ලැබී ඇති බැවින් ප්‍රමාද ගාස්තු ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු කරන බවත් හිඟ කුලිය ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | නව වෙළඳ සංකීර්ණයේ කඩකාමරයක් 2013 වර්ෂයේදී ගිවිසුමක් මඟින් රු. 3,420 ක මාසික කුලියකට බදු දී තිබුණි. බදු කාලය අවසන්වීමෙන් පසු 2017 වර්ෂය දක්වා ගිවිසුම් රහිතව කඩකාමරය පවත්වාගන යාමට ඉඩහැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ බදුකුලී හා දඩ රු. 202,895 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර අදාල කඩකාමරය 2017 අගෝස්තු සිට ආදායම් ඉපයීමකින් තොරව වසා දමා තිබුණි. | ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළයුතු අතර, කඩකාමරය බදුදී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩකාමරය තෙවරක් ටෙන්ඩර් කලද ඒ සඳහා බදුකරුවන් ඉදිරිපත් වී නොමැති බවත්, TYPE 01 සංකීර්ණයේ කඩකාමර සමඟ මෙම කඩකාමරය ද බදු ලබා දීමට කටයුතු කරන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සුසාන භූමි ලේඛනයේ ඇතුලත් සුසාන භූමි 50 න් 49 ක් පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාල ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හොලීපිටිය උඩවත්ත සුසාන භූමිය පවරා ගනු ලැබූ බවත් සුසාන භූමි කිහිපයක පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් දන්වමි. |
| (ඈ) | 2013 හා 2017 වර්ෂ වලදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් හා සබරගමුව පළාත් සභාවෙන් ලැබුණු ගලි ටේලර් 02 ක් මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් නොමැති වීම හේතුවෙන් සභා භූමිය තුල නිෂ්කාර්යව තිබුණි. | අදාල සේවා සපයන පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට හෝ පියවර ගත යුතුවේ. | මල අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති වීම නිසා ගලි ටේලර් 02 ක් සභා භූමිය තුල පවතින බව දන්වමි. |